කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

*වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය*

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011

2013 දෙසැම්බර්

**BMGT E 1025 – ව්‍යාපාර ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

**ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(01) අ) මූල්‍ය ප්‍රකාශනවල අඩංගු විය යුතු ගුණාත්මක ලක්ෂණ තුනක් උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 02)

ආ) මූල්‍ය තොරතුරු භාවිතා කරන පාර්ශව ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාද සහිතව සඳහන් කරන්න.

(ලකුණු 03)

ඇ) ගිණුම්කරණ සමීකරණය උපයෝගීකරගෙන පහත ගණුදෙනු සටහන් කරන්න.

(i) රු. 2,000 ක් වටිනා භාණ්ඩ රු. 2,500 කට විකිණීම

(ii) අයිතිකරු විසින් සිදුකරන ලද භාණ්ඩ ගැනිලි රු. 1,000

(ලකුණු 02)

ඈ) සමාගමක බදු පසු ශුද්ධ ලාභය රු. 300,000 විය . එහි ප්‍රාග්ධනය එකක් රු. 10/= බැගින් වූ 2% වරණීය කොටස් 200,000 ද, රු. 10 යේ සාමාන්‍ය කොටස් 100,000 කින් සමන්විත වේ. වසර තුලදී සාමාන්‍ය කොටස් හිමියන් සඳහා ලාභාංශ නොගෙවූ අතර ඉතිරි ලාභය සංචිත වලට මාරු කරන ලද්දේ නම්, වසර තුලදී සංචිතයට මාරු කළ ලාභය ගණනය කරන්න.

(ලකුණු 01)

ඉ) ආයතනයක මාසික සුළු මුදල් අග්‍රිමය රු. 2,000 කි. මාසය තුලදී වියදම් කල මුදල රු. 1,400 ක් නම් මාසය අගදී ප්‍රතිපූර්ණය කරන මුදල කීයද?

(ලකුණු 01)

ඊ) ණයගැතියෙකු විසින් කළ ගෙවීමක් විවිධ ආදායමක් ලෙස සලකා පොත්වල සටහන් කර ඇත. මෙම ගණුදෙනුව නිසා අවිනිශ්චිත ගිණුමට වන බලපෑම ගණනය කර ඉහත වරද නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජ'නල් සටහන සඳහන් කරන්න.

(ලකුණු 01)

එ) ආයතනයක ගැණුම් හා විකුණුම් විස්තර පහත සපයා ඇත.

**මිලදී ගැනීම්**

| | ඒකක ගණන | ඒකකයක මිල |
|---|---|---|
| 2011 දෙසැම්බර් 25 | 200 | රු. 25 |
| 2012 ජනවාරි 20 | 1000 | රු. 20 |
| 2012 පෙබරවාරි 25 | 500 | රු. 20 |
| 2012 මාර්තු 30 | 300 | රු. 30 |

**විකුණුම්**

| මිල | ඒකක ගණන | ඒකකයක |
|---|---|---|
| 2011 දෙසැම්බර් 28 | 50 | රු. 50 |
| 2012 ජනවාරි 26 | 600 | රු. 50 |
| 2012 පෙබරවාරි 25 | 200 | රු. 40 |
| 2012 මාර්තු 30 | 100 | රු. 40 |

පළමු ඇතුලු පළමු පිට (FIFO) ක්‍රමය යටතේ තොග ආගනනය කෙරේ නම්, 2012 මාර්තු 31 දිනට අවසන් තොගයේ වටිනාකම ගණනය කරන්න.

(ලකුණු 02)

ඒ) බොලොක් සමාගම රු. 100,000 වූ අමුද්‍රව්‍ය මිලදී ගත් අතර ඉන්වොයිස් වටිනාකමක් 2% ක වට්ටමක් ලැබිණි. ආනයන බදු ලෙස රු. 20,000 වූ අතර ඉන් රු. 5,000 ක් බදු බැරක් ලෙස නැවත ලබාගත හැක. මෙම භාණ්ඩ නිදහස් කරගැනීම සඳහා රු. 7,000 ක් නියෝජිතයෙකුට ගෙවීය. එසේම මෙම භාණ්ඩ රු. 3,000 ක කුලී ගෙවා ගබඩාවක තැන්පත් කර තිබූ අතර ආරක්ෂක නිලධාරියාට රු. 2,000 ක් මේ සඳහා ගෙවීය.
අවශ්‍ය වන්නේ, අමුද්‍රව්‍ය පිරිවැය ගණනය කිරීම

(ලකුණු 02)

ඔ) ව්‍යාපාරයක් සතු වත්කමක 2013 මාර්තු 31 න් අවසන් දිනට ධාරණ අගය තීරණය කිරීම සඳහා පහත තොරතුරු ඔබට ලබා දී ඇත.

පිරිවැය රු. 200,000

සමුච්චිත ක්ෂය රු. 60,000

කළමනාකරුවන් තීරණය කරන ලද භාවිත අගය (value in use) රු. 150,000

වත්කමේ සාධාරණ අගය (fair value) රු. 140,000

අපේක්ෂිත විකුණුම් වියදම් රු. 10,000

(ලකුණු 02)

ඖ) 2008 ජනවාරි මස පිරිවැය රු. 200,000 ක් වූ යන්ත්‍රෝපකරණ අත්පත්කරගත් අතර, එහි සුන්බුන් අගය රු. 10,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. එහි ඵලදායී ජීවකාලය වසර 10 කි. වසර තුනකට පසුව එනම්, 2011 ජනවාරි මස මෙම වත්කම විකිණීම

සඳහා ඇති වත්කමක් (Asset held for sale) ලෙස වර්ගීකරණය කරන ලදී. මෙදින මෙම වත්කමේ සාධාරණ අගය රු. 80,000 ලෙස සහ තැරැව් ගාස්තු ලෙස රු. 4,000 ක් දැරීමට සිදුවන බව ඇස්තමේන්තු කළේය. 2011 ජූනි 30 දින මෙම වත්කම රු. 96,000 ට විකුණන ලදී.

අවශ්‍ය වන්නේ, 2011 ජනවාරි මාසයේ පොත්වල පෙන්විය යුතු යන්ත්‍රෝපකරණයේ අගය හා වත්කම විකිණීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය ගණනය කිරීම.

(ලකුණු 04)

ඔ) මෙගා සමාගම විසින් එකක් රු. 11/- වූ සාමාන්‍ය කොටස් 200,000 ක් මහජනයාට පහත පරිදි ගෙවීම සඳහා නිකුත් කරන ලදී.

අයදුමේදී රු. 3
විභජනයේදී රු. 5
පළමු හා අවසන් ඇරයුමේදී රු. 3

කොටස් 400,000 සඳහා අයදුම්පත් ලැබුනු අතර සමානුපාතික විභජන පදනම මත කොටස් විභජනය කරන ලදී. කොටස් 4000 ක් සඳහා අයදුම් කර කොටස් 2000 ක් ලැබුනු අරුණ විභජන මුදල් ගෙවීමට අසමත් විය. ඔහුගේ කොටස් එකක් රු. 8/- බැගින් අරුණට පැවරීය. මේ සඳහා දරණ ලද වියදම රු. 4,000 කි.

තවත් කොටස් අයදුම්කරුවකු වූ රංග කොටස් 1000 සඳහා ඇරයුම් මුදල් ගෙවීමට අසමත් විය. පසුව මෙම කොටස් එකක් රු. 12/- බැගින් අමල්ට පැවරීය. මේ සඳහා රු. 4,300 ක් වියදම් දැරීමට සිදුවිය.

අවශ්‍ය වන්නේ, ඉහත ගණුදෙනු සටහන් කිරීම සඳහා අවශ්‍ය ජ්නල් සටහන්.

(ලකුණු 05)

(මුළු ලකුණු 25)

(02) පින් සමාගම විසින් 2007-12-15 දින කින් සමාගමේ ශුද්ධ වත්කම්වලින් 75% ක් අත්පත්කරගත් අතර එදිනට කින් සමාගමේ රඳවාගත් ඉපයුම් රු. 165,000 විය. සමාගම් දෙකෙහිම 2013 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන් පහත පරිදි වේ.

| | පින් සමාගම රු. | කින් සමාගම රු. |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | 315,000 | 635,000 |
| කින් සමාගමේ ආයෝජනය | 900,000 | - |
| ජංගම වත්කම් | 410,000 | 246,000 |
| | **1,625,000** | **881,000** |
| **හිමිකම්** | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 900,000 | 225,000 |
| රඳවාගත් ඉපයුම් | 423,000 | 615,000 |
| | **1,323,000** | **840,000** |

| | | |
|---|---|---|
| වගකීම් | 302,000 | 41,000 |
| | **1,625,000** | **881,000** |

අනෙකුත් තොරතුරු

- පින් සමාගම විසින් වර්ෂය තුලදී පිරිවැයට 25% ක් එකතුකර කින් සමාගමට භාණ්ඩ විකුණන ලදී. වර්ෂය අවසානයේදී කින් සමාගමේ තොගවල පින් සමාගමින් මිලදී ගත් ඉන්වොයිස් අගය රු. 8,000 ක් වූ තොග ඇතුලත් විය.
- කීර්තිනාමයේ අගය 10% ත් අවකරණය වන බවට ඇස්තමේන්තු කෙරිණි.

අවශ්‍ය වන්නේ,

2013-03-31 දිනට පින් සමාගමේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

(ලකුණු 20)

(03) පවන් සමාගම සතු මාතර ශාඛාව සඳහා, පින්ට් සමාගම විසින් භාණ්ඩ පිරිවැයට නිකුත් කරනු ලබයි. මාතර ශාඛාව වෙනමම ගිණුම් පොත් පිළියෙල කරන අතර ශාඛාවේ ස්ථාවර වත්කම් සඳහා අදාල සටහන් ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලැබේ.

2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මාතර ශාඛාවේ තොරතුරු ඔබට සපයා ඇත.

| | **01/04/2012** | **31/03/2013** |
|---|---|---|
| ප්‍රධාන කාර්යාල ගිණුම් (ප්‍රධාන කාර්යාලයේ ශාඛා ජංගම ගිණුම සමඟ තුලනය වූ අගය) | 250,000 | - |
| වෙළඳ ණයගැතියෝ | 377,000 | 335,000 |
| වෙළඳ ණයහිමියෝ | 117,000 | 113,000 |
| තොග | 73,000 | 84,000 |

**වර්ෂය තුල සිදුවූ ගණුදෙනු පහත පරිදි වේ.**

| | |
|---|---|
| වර්ෂය තුලදී ණයගැතියන්ගෙන් ලද මුදල් | 1,069,000 |
| වර්ෂය තුලදී ණයහිමියන්ට මුදල් ගෙවීම් | 632,000 |
| වර්ෂය සඳහා ශාඛාවේ වියදම් | 110,000 |
| යන්ත්‍රෝපකරණ මිලදී ගැනුම් (2012/04/01) | 250,000 |
| ප්‍රධාන කාර්යාලයෙන් ලද භාණ්ඩ | 192,000 |
| වසරතුලදී ප්‍රධාන කාර්යාලයට කල මුදල් ප්‍රේෂණ | 333,000 |

අනෙකුත් තොරතුරු :

(i) ශාඛාවේ ක්ෂය ප්‍රතිපත්තියට අනුව යන්ත්‍ර 10% ද, ලීබඩු මත 12% ද සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරනු ලබයි. රු. 72,000 ක් වටිනා ලී බඩු ශාඛාව සතුය.

(ii) ප්‍රධාන කාර්යාලය විසින් ශාඛාවට අදාල වූ රු. 24,000 ක වියදම් දරා ඇත.

(iii) 2013-මාර්තු 31 දිනට ශාඛාවට යැවූ භාණ්ඩවලින් රු. 33,000 ක භාණ්ඩ මාර්ගස්ථව පවතින අතර ශාඛාවෙන් ප්‍රධාන කාර්යාලයට යැවූ මුදල් වලින් රු. 43,000 ක් මාර්ගස්ථව ඇත.

අවශ්‍ය වන්නේ,

ආ) 2013 මාර්තු 31 දිනට ප්‍රධාන කාර්යාලයේ පොත්වල දැක්වෙන පරිදි ශාඛා ජංගම ගිණුම.

(ලකුණු 06)

ආ) ශාඛාවේ පොත්වල දැක්වෙන පරිදි 2013 මාර්තු 31 දිනට ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුම.

(ලකුණු 06)

ඇ) 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශාඛාවේ ශුද්ධ ලාභය ගණනය කිරීම.

(ලකුණු 03)

(මුළු ලකුණු 15)

(04) අමල්, කමල් හා නිමල් 1:1:3 අනුපාතයට ලාභ අලාභ බෙදාගන්නා හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ය. 2013-12-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත පරිදි වේ.

| ස්ථාවර වත්කම් | පිරිවැය | සමුච්චිත ක්ෂය | ශුද්ධ අගය |
|---|---|---|---|
| ගොඩනැගිලි | 180,000 | 10,000 | 170,000 |
| මෝටර් රථ | 27,500 | 5,500 | 22,000 |
| | 207,500 | 15,500 | 192,000 |

| | | |
|---|---|---|
| **ජංගම වත්කම්** | | |
| තොග | 68,250 | |
| ණයගැතියෝ | 171,235 | |
| මුදල හා බැංකු | 26,065 | |
| | 265,550 | |
| **අඩුකලා - ජංගම වගකීම්** | | |
| ණයහිමියෝ | (60,000) | |
| කාරක ප්‍රාග්ධනය | | 205,550 |
| | | 397,550 |
| ප්‍රාග්ධන ගිණුම්: අමල් | 100,000 | |
| කමල් | 40,000 | |
| නිමල් | 140,000 | 280,000 |
| ජංගම ගිණුම්: අමල් | 30,000 | |
| කමල් | (10,000) | |
| නිමල් | 70,000 | 90,000 |
| සංචිත | | 20,000 |
| **දිගුකාලීණ වගකීම්** | | |
| දිගුකාලීන ණය - නිමල් | | 7,550 |
| | | 397,550 |

2014 ජනවාරි 01 දින හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට, හවුල්කරුවන් විසින් තීරණය කරන ලදී. මෙදින වත්කම් පහත පරිදි උපලබ්ධි වූ අතර වගකීම් පහත පරිදි පියවන ලදී.

- ගොඩනැගිලි රු. 220,000 ට විකුණන ලදී. ඒ සඳහා වූ නෛතික ගාස්තු රු. 11,500 කි.
- නිමල් විසින් තොග හා මෝටර් රථය පොත් අගයට අත්පත් කරගන්නා ලදී.
- රු. 2,500 ක ණයගැතියෙකු වූ සුනිල් හැර සියලුම ණය අයකරගන්නා ලදී.
- ණයහිමියන් රු. 56,000 ක් ගෙවා පියවන ලදී.
- උපලබ්ධි වියකම් ලෙස රු. 10,000 ක් ගෙවන ලදී.

ඔබ විසින් 2014/1/1 දිනට පහත දෑ පිළියෙල කරන්න.

ආ) උපලබ්ධි ගිණුම

ආ) බැංකු ගිණුම

ඇ) ප්‍රාග්ධන ගිණුම

(ලකුණු 15)

(05) කුමුදු සමාගමේ 2013 මාර්තු 31 දිනින් අවසන් වර්ෂය සඳහා උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | රු. | රු. |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 2,750,000 | - |
| කාර්යාල උපකරණ | 120,840 | - |
| මෝටර් රථ | 246,960 | - |
| 2012-04-01 දිනට ක්ෂය සඳහා වෙන්කිරීම් | - | |
| ගොඩනැගිලි | | 187,500 |
| කාර්යාල උපකරණ | | 54,378 |
| මෝටර් රථ | | 59,270 |
| විකුණුම් | - | 9,690,000 |
| විකුණුම් පිරිවැය | 5,053,680 | |
| තොග පිරිවැයට | 405,360 | - |
| වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ | 951,240 | - |
| මුදල් ශේෂය | 41,370 | - |
| බෙදාහැරීමේ වියදම් | 915,240 | - |
| ආයතන හා පරිපාලන වියදම් | 722,560 | - |
| ලද වට්ටම් | - | 180,000 |
| මූල්‍ය වියදම් | 727,200 | - |
| කුලී ආදායම් | - | 480,000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු. 12/-) | - | 1,305,600 |
| අයහාර සංචිත | - | 1,706,880 |
| ආයෝජන | 3,583,588 | - |
| 2012-04-01 දිනට ආදායම් බදු සඳහා වෙන්කිරීම් | - | 96,000 |
| ආදායම් බදු ගෙවීම් - | - | - |
| 2011/ 2012 තක්සේරු වර්ෂය සඳහා | 90,000 | - |
| 2012/ 2013 තක්සේරු වර්ෂය සඳහා | 42,000 | - |
| දිගුකාලීන ණය | - | 1,005,600 |
| කෙටිකාලීන ණය | - | 277,530 |
| වෙළඳ හා අනිකුත් ගෙවිය යුතු දෑ | - | 456,800 |
| බැංකු අයිරාව | - | 150,480 |
| | **15,650,038** | **15,650,038** |

අනෙකුත් තොරතුරු

(i) 2013-03-31 දින තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 397,000

(ii) 2013-04-05 දිනට ආයෝජනවල අගය රු. මිලියන 3.6 ක් දක්වා ඉහල ගොස් ඇත.

(iii) 2012/2013 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු. 100,000 ලෙස ඇස්තමේන්තු කර ඇත. 2011/ 12 සඳහා වූ මුළු ආදායම් බදු වගකීම ගෙවා නිම කර ඇත.

(iv) සේවයෙන් පහකරන ලද සේවකයකු විසින් ආයතනයට විරුද්ධව රු. 200,000 ක් ඉල්ලා නඩු පවරා ඇත. සමාගමේ නීතිඥවරුන්ගේ මතය වන්නේ සමාගමට මෙය ගෙවීමට සිදුවන බවයි.

(v) ගොඩනැගිල්ලේ වටිනාකම රු. 750,000 කි. එය සරල මාර්ග ක්‍රමය මත 10% ක්ෂය කරයි. හීනවන ශේෂ ක්ෂය ක්‍රමය මත කාර්යාල උපකරණ හා මෝටර් රථ පිළිවෙලින් 15% හා 12% ක් ක්ෂය කල යුතුය.

(vi) 2013 මාර්තු 31 දින ඉඩම් රු. මිලියන 2.5 කට ප්‍රත්‍යාගණනය කල අතර මෙය සමාගමේ පොත්වල වාර්තා කර නොමැත.

අවශ්‍ය වන්නේ, ප්‍රසිද්ධ කිරීම සඳහා කුමුදු සමාගමේ,

(අ) 2013-03-31 දිනින් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

(ආ) 2013-03-31 දිනින් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(ඇ) 2013 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

(මුලු ලකුණු 25)